# ප්‍රමුඛතා මූලික සත්කාර මධ්‍යස්ථාන

**OFFICIAL**
**Sinhalese | සිංහල**

- ඔබට කඩිනමින්වෛද්‍යවරයකු හමුවීමට අවශ්‍යද?
- හදිසි තුවාල හෝ අසනීප තත්ත්වයන් ඇති ඕනෑම කෙනෙකු සඳහා ප්‍රමුඛතා මූලික සත්කාර මධ්‍යස්ථාන (PPCCs) මගින් නොමිලේ ප්‍රතිකාර සැපයේ.
- රෝහලේ හදිසි අනතුරු අංශයට වඩා කඩිනමින් ඔබට අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට PPCCහි වෛද්‍යවරු ඔබට උපකාර කරනු ඇත.
- සුළු ආසාදන, සුළු පිළිස්සීම්, උළුක්කු හෝ අස්ථි බිඳීම් බවට සැකකෙරෙන අවස්ථාවන් සඳහා ඔවුන්ට ප්‍රතිකාර කළ හැකිය.
- ඔබට දරුණු තුවාලයක් හෝ අසනීපයක් ඇත්නම් බිංදු තුන (000) අමතන්න.
- ඔබට කඩිනම් ප්‍රතිකාර අවශ්‍ය නැත්නම් ඔබේ සාමාන්‍ය වෛද්‍යවරයා සමග හමුවීමක් යොදා ගන්න.
- ඔවුන්ගේ සේවාවලට ව්‍යාධිවේදය, විකිරණවේදය හා ඖෂධ ඇතුළත් වේ.
- PPCC සේවා මෙඩිකෙයා කාඩ්පතක් ඇති නැති ඕනෑම අයෙකුට නොමිලේ සැපයේ.
- PPCC සතියේ දින 7 දීම වැඩ කරන පැය ගණන ඉක්මවා විවෘතව තිබේ.
- ඔබ විසින් හමු වීමේ වේලාවක් වෙන් කර ගැනීමට අවශ්‍ය නැත.
- වික්ටෝරියාව පුරා PPCC විවෘත වෙමින් පවතියි.
- ස්ථාන හා වැඩිදුර තොරතුරු සඳහා Better Health Channel වෙත යන්න: www.betterhealth.vic.gov.au/health/servicesandsupport/priority-primary-care-centres
- PPCC හි භාෂණ පරිවර්තකයෝ සිටිති. 131 450 ඔස්සේ පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව TIS අමතන්න.